## ශ්‍රී ලංකා
## ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## පාර්ලිමේන්තුව

---

# 1981 අංක 62 දරන
# රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 ඔක්තෝබර් මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි.

# 1981 අංක 62 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 සැප්තැම්බර් මස 28 වන දින]

එල්. ඩී.—ඕ. 37/80.

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1981 අංක 62 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 31 වන වගන්තිය මෙහි පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන පනතේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) (ම) ඡේදයේ "කිරීම; සහ" යන වචන වෙනුවට "කිරීම;" යන වචනය එම උපවගන්තියට ආදේශ කිරීමෙන්;

(ආ) (ය) ඡේදයේ "සංවිධානයක් පිහිටුවීම." යන වචන වෙනුවට "සංවිධානයක පිහිටුවීම; සහ" යන වචන එම උපවගන්තියට ආදේශ කිරීමෙන්; සහ

(ඇ) එම උපවගන්තියේ (ය) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(අඅ) බැංකුවේ යම් ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමට හා ඒ කටයුතුවල යෙදීමට අවශ්‍ය යයි බැංකුව විසින් සලකනු ලැබිය හැකි යම් නිශ්චල දේපළක් මිල දී ගැනීම, බදු ගැනීම හෝ හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් අත් කර ගැනීම."; සහ

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(1අ) බැංකුව විසින් ණයක් දෙනු ලැබ ඇති සහ එම ණය සඳහා ඇප වශයෙන් උකස් කරන ලද දේපළ යම් උකසක් මගින් බැංකුව හැර වෙනත් යම් තැනැත්තකු වෙත බැඳ නැති අවස්ථාවක, බැංකුව විසින්, ණය දීම සම්බන්ධයෙන් වූ මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, අමතර ණයක් දෙනු ලැබිය හැකි අතර එම ණය මුදල ආපසු ගෙවීම එම දේපළ තවදුරටත් උකස් කිරීමෙන් ආරක්ෂා කරනු ලැබිය යුතු ය. තවද, ඒ තවදුරටත් වූ උකස මුල් උකසක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.".

1—ඒ 57772—12,425 (81/07)

ප්‍රධාන ප්‍රඥප්තියට 50අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 50අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :—

" බැංකුවට උකස් කරන ලද දේපළ විකිණීම සඳහා 50 වන වගන්තිය යටතේ බලය පවරන ලද තැනැත්තා වෙනුවට වෙනත් යම් තැනැත්තකුට බලය පැවරීම.

50අ. (1) 50 වන වගන්තිය යටතේ බලය පවරන ලද යම් තැනැත්තකු මිය ගිය අවස්ථාවක හෝ ඒ තැනැත්තා විසින් රෝගාතුරවීම හෝ වෙනත් යම් හේතුවක් නිසා කවර වූ හෝ විටක දී එම වගන්තිය යටතේ ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවක, මණ්ඩලය විසින්, ගෙවීම පැහැර හරින ලද්දේ යම් ණයක් සම්බන්ධයෙන් ද ඒ ණය සඳහා ඇප වශයෙන් බැංකුවට උකස් කරන ලද යම් නිශ්චල හෝ චංචල දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා ලියා වාර්තාගත කළ යුතු යෝජනා සම්මතයක් මගින් වෙනත් යම් තැනැත්තකුට බලය පැවරිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඒ වෙනත් තැනැත්තාට බලය පවරන ලද දිනයට කලින් ප්‍රසිද්ධ වෙන්දේසියේ වූ විකිණීමක් සම්බන්ධයෙන් 50 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් බලය පවරන ලද තැනැත්තා විසින් කරනු ලැබූ සියලු ක්‍රියා හා දේවල් ඒ විකිණීම සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය සියලු කටයුතු කළ යුතු, (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන එම තැනැත්තා විසින් කරනු ලැබූ ක්‍රියා හා දේවල් වශයෙන් සලකනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියේ (2) වන උපවගන්තිය මෙහි පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම උපවගන්තියේ (ආ) ඡේදයේ " ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නමින් හෝ කෘෂිකාර්මික සහ කාර්මික ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය නමින් " යන වචන වෙනුවට " ලංකා රජයේ උකස් බැංකුවේ නමින් හෝ කෘෂිකාර්මික සහ කාර්මික ණය සංස්ථාවේ නමින් " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම උපවගන්තියේ (ඉ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ඉ) ඒ දිනයට ඉහතින් ම වූ දිනයෙහි පවතින හෝ බලපැවැත්වෙන හා ලංකා රජයේ උකස් බැංකුව විසින් හෝ කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථාව පාර්ශ්වකරුවකු වශයෙන් නම්කර ඇති හෝ අත්සන් කර ඇති සියලු ගිවිසුම්, ඔප්පු, උකස් බැඳුම්කර සහ වෙනත් බැඳුම්කර, එකඟවීම් සහ වෙනත් සාධන පත්‍ර, ඒ ලංකා රජයේ උකස් බැංකුව හෝ කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථාව වෙනුවට මෙම බැංකුව ඊට පාර්ශ්වකරුවකු වූ ලෙස

සම්පූර්ණයෙන් හා බල සහිතව, අවස්ථාවෝචිත පරිදි, බැංකුවට විරුද්ධව හෝ බැංකුවේ වාසියට බල පැවැත්විය යුතු අතර ඒ තුළ ඇති ලංකා රජයේ උකස් බැංකු ආඥාපනත හෝ කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථා ආඥාපනත පිළිබඳ සෑම සඳහන් කිරීමක්ම මේ පනත සහ ඒ යටතේ සාදනු ලබන සියලු රීති හා නියෝග පිළිබඳ සඳහන් කිරීමක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.";

(3) එම උපවගන්තියේ (ඊ) ඡේදයේ—

(i) "ලංකා රජයේ උකස් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හෝ ඒ අධ්‍යක්ෂ මණ්ඩලයට විරුද්ධව" යන වචන වෙනුවට "ලංකා රජයේ උකස් බැංකුව විසින් හෝ කෘෂිකාර්මික සහ කාර්මික ණය සංස්ථාව විසින් හෝ ඒ බැංකුවට හෝ සංස්ථාවට විරුද්ධව" යන වචන ; සහ

(ii) "ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය." යන වචන වෙනුවට "ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය ;"; යන වචන

ආදේශ කිරීමෙන් ; සහ

(4) එම උපවගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

'(උ) (i) ඒ දිනට පෙරාතුව ම වූ දින දී, ලංකා රජයේ උකස් බැංකු ආඥාපනතේ 94 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ පිහිටුවනු ලැබූ ලංකා රජයේ උකස් බැංකු අර්ථසාධක අරමුදලේ බැරට ඇති අයිතිවාසිකම්, බැඳීම්, වත්කම්, බැරකම් සහ මුදල්, මේ පනතේ 31 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ "අ" රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු අර්ථසාධක අරමුදලේ අයිතිවාසිකම්, බැඳීම්, වත්කම්, බැරකම් සහ මුදල් විය යුතු ය ; තවද

(ii) ඒ දිනට පෙරාතුව ම වූ දින දී, කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථා ආඥාපනතේ 51 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඔ) ඡේදය යටතේ පිහිටුවනු ලැබූ කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථා අර්ථසාධක අරමුදලේ බැරට ඇති අයිතිවාසිකම්, බැඳීම්, වත්කම්, බැරකම් සහ මුදල්, මේ පනතේ 31 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ "ආ" රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු අර්ථසාධක අරමුදලේ අයිතිවාසිකම්, බැඳීම්, වත්කම්, බැරකම් සහ මුදල් විය යුතු ය ;

(ඌ) ලංකා රජයේ උකස් බැංකු අර්ථසාධක අරමුදලේ නමින් කරන ලද සෑම ආයෝජනයක් ම මේ පනතේ 31 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ "අ"

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු අර්ථසාධක අරමුදල විසින් කරන ලද ආයෝජන වශයෙන් සැලකිය යුතුය ; තව ද, කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථා අර්ථසාධක අරමුදලේ නමින් කරන ලද සෑම ආයෝජනයක්ම මේ පනතේ 31 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ "ආ" රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු අර්ථසාධක අරමුදල විසින් කරන ලද ආයෝජන වශයෙන් සැලකිය යුතු ය ;

(එ) ඒ දිනයට ඉහතින්ම වූ දිනයෙහි පවතින හෝ බලපැවැත්වෙන හා ලංකා රජයේ උකස් බැංකු අර්ථසාධක අරමුදල විසින් හෝ කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථා අර්ථසාධක අරමුදල විසින් අත්සන් කර ඇති සියලු ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම් සහ වෙනත් සාධන පත්‍ර, අවස්ථාවෝචිත පරිදි ලංකා රජයේ උකස් බැංකු අර්ථසාධක අරමුදල හෝ කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථා අර්ථසාධක අරමුදල වෙනුවට, "අ" රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු අර්ථසාධක අරමුදල හෝ "ආ" රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු අර්ථසාධක අරමුදල ඊට පාර්ශ්වකරුවකු වූ ලෙස සම්පූර්ණයෙන් හා බලසහිතව, අවස්ථාවෝචිත පරිදි, මේ පනතේ 31 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ "අ" රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු අර්ථසාධක අරමුදලට හෝ "ආ" රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු අර්ථසාධක අරමුදලට, විරුද්ධව හෝ එහි වාසියට බලපැවැත්විය යුතු ය ; තවද,

(ඒ) ලංකා රජයේ උකස් බැංකු අර්ථසාධක අරමුදල විසින් හෝ කෘෂිකාර්මික හා කාර්මික ණය සංස්ථා අර්ථසාධක අරමුදල විසින් පවරනු ලැබ හෝ ඒ අරමුදල් වලට විරුද්ධව පවරනු ල බ ඒ දිනයට ඉහතින්ම වූ දිනයෙහි පවත්නා සියලු නඩු, අභියාචන හෝ වෙනත් නීති කටයුතු ඒ ඉවත් කිරීමේ හේතුවෙන් නතරවීම හෝ අවසන් කරනු ලැබීම හෝ කවර හෝ ආකාරයකින් හානිකර ලෙස බලපෑමක් ඇතිවීම නොවිය යුතු අතර ඒ අනුව, අවස්ථාවෝචිත පරිදි මේ පනතේ 31 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ "අ" රජයේ උකස් හා ආයෝජන බැංකු අර්ථසාධක අරමුදල විසින් හෝ "ආ" රජයේ උකස් හා ආයෝජන බැංකු අර්ථසාධක අරමුදල විසින් දිගට ම පවත්වාගෙන යාම හෝ බලාත්මක කිරීම නැතහොත් ඒ අරමුදල්වලට විරුද්ධව දිගටම පවත්වාගෙන යාම හෝ බලාත්මක කිරීම කළ හැකි ය.'.

සංශෝධන අතීතයට බලපෑම.

**5.** මේ පනතේ ඉහතින් වූ විධිවිධාන මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධන සියලු කාර්ය සඳහා 1979 ජනවාරි මස 1 වන දින පටන් බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 60 කි. (විදේශීය) රු. 80 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.